

# විග්නේෂ්වරන්ට ඉරිසියා කරමු

අජිත් පැරකුම් ජයසිංහ

ආණ්ඩුව උතුරු පළාත් සභා මැතිවරණය වෙනුවෙන් කර තිබෙන සුවිශේෂ තේරීම වන්නේ කොටි සංවිධානයේ හිටපු මාධ්‍ය ප්‍රකාශක දයා මාස්ටර් ය.

දයා මාස්ටර් තම මාධ්‍ය ප්‍රකාශකවරයා බවට පත් කිරීම කොටි සංවිධානයේ ද මුග්ධකමකි. දයා මාස්ටර් වැනි චරිතයක් මාධ්‍ය ප්‍රකාශකවරයා බවට පත් කිරීමෙන් කොටි සංවිධානය ප්‍රකාශ කළේ ම ජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතියට නිගරුවකි. එය කොටි සංවිධානයේ මාධ්‍ය ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීමක් විය හැකි ය.

කිලිනොච්චියේ කොටින්ගේ මාධ්‍ය සම්බන්ධීකරණය සිදු කෙරුනු නිවසක් භාරව සිටි, ඉංග්‍රීසි ටියුෂන් ගුරුවරයකුව සිටි එහෙත් ඉංග්‍රීසි කතා කළ නො හැකි අසරණ පෙනුමක් ඇති මේ මිනිසාට වඩා විප්ලවීය තේරීමක් ආණ්ඩුවට උතුර සම්බන්ධයෙන් නැති වීම ඇත්තෙන් ම ආණ්ඩුවේ අසරණකම ප්‍රදර්ශනය කිරීමකි.

එහෙත්, දෙමළ ජාතික සන්ධානය සිය මහ ඇමති අපේක්ෂකයා ලෙස හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු වූ සී.වී. විග්නේශ්වරන් තෝරාගෙන තිබේ. ඔහු දේශපාලනයට අලුත් මිනිසෙකි. මම එහුට කැමැත්තක් දක්වන්නේ ඔහු තුළ ඇති ඇතැම් පුළුල් ලක්ෂණ හේතුවෙනි. සිය භාෂාවට, ජාතියට, ආගමට ගරු කරන ගමන් ම ඔහු පුළුල් ලාංකික අනන්‍යතාවක් සිය පවුලේ ජීවිතය තුළින් ප්‍රකාශයට පත් කරයි. ඔහුගේ දියණියක් විවාහ වන්නට නියමිත වාසුදේව නානායක්කාරගේ පුතා සමගයි. පුතෙකු විවාහ වන්නට නියමිත කේසරලාල් ගුණසේකරගේ දියණියක් සමගයි.විග්නේශ්වරන්ගේ දරුවෝ සිංහල, දෙමළ අනන්‍යතාවන් ඉක්මවා ගිය ලාංකික අනන්‍යතාවක නිහඬ ප්‍රකාශකයෝ වෙති.

අද සන්ඩේ ටයිම්ස් පුවත්පතේ නාමිනි විජේදාස විග්නේශ්වරන් හමු වී සාකච්ඡා කර ලියා තිබෙන විශේෂාංග ලිපිය කියවූ විට ඔහුගේ තවත් ලක්ෂණ කීපයක් දැක ගත හැකි ය. විදෙස් මාධ්‍යයක් දෙමළ ජනයාගේ ස්වයං නිර්ණ හිමිකම පිළිබඳ ඔහුගේ අදහස විමසයි. ඔහු කියන්නේ එම කරුණ අදාළ වන්නේ දේශපාලකයකු ට මිස තමාට නො වන බවයි. ඔහු තමන් හඳුන්වන්නේ දෙමළ ජනයාගේ බිඳ වැටුණු ජීවිත යළි ගොඩනැඟීම සඳහා කටයුතු කරන නිලධාරියකු ලෙසයි. ඔහු කියන්නේ මේ අවස්ථාවේ උතුරු පළාත් සභාවේ නායකත්වය සඳහා අවශ්‍ය වන්නේ ආණ්ඩුව, ඉන්දියාව හා ජාත්‍යන්තර ප්‍රජාව සමග කටයුතු කළ හැකි අයෙකු බවයි.

එසේම, එම පුද්ගලයා සිංහල ප්‍රගතිශීලීන් සමග කටයුතු කළ හැකි පුද්ගලයකු විය යුතු ය යන්න ද විග්නේශ්වරන් තේරුම් ගත යුතු ය. ලංකාවේ දෙමළ දේශපාලන ව්‍යාපාර කිසිදා හරි හැටි තේරුම් නො ගත් කරුණක් විග්නේශ්වරන්ට ද තවම ස්පර්ශ වී නැති බව පෙනේ. ඒ වනාහි ආණ්ඩුවත්, සිංහල ජාතිවාදීනුත් නො වන සිංහල ප්‍රජාවක් ඇති බවයි.දෙමළ නායකයින් විසින් සහජීවනය වෙනුවෙන් ඉලක්ක කළ යුතුව තිබෙන්නේ එම ප්‍රජාවයි.

කොටි සංවිධානය ඇතුළු දෙමළ ජාතිවාදීහු මෙම ප්‍රජාව හිතාමතා ම අමතක කර දැමූහ. නැතිනම් එයින් කොටසක් තමන්ගේ ජාතිවාදී උවමනාවන් වෙනුවෙන් කඩේ යැවූ හ. දෙමළ ජාතිවාදීන් හැම විට ම පෙම් කළේ සිංහල ජාතිවාදීන්ටයි. ඔවුන්ට අවශ්‍ය දෙය කළේ සිංහල ජාතිවාදීහු ය.

විග්නේශ්වරන්ගේ සාර්ථකත්වය රඳා පවතින එක් මර්මස්ථානයක් වන්නේ එයයි. ඔහු උත්සාහ කළ යුතුව තිබෙන්නේ ප්‍රාදේශීය දෙමළ නායකයකු වීමට නො වේ. ජාතික නායකයකු වීමටයි. ඒ සඳහා විභවයන් ඔහු සතු ය.

ඇත්තම කීවොත්, ඔහු සිංහල ජනයාට ඉරිසියා කළ හැකි තෝරාගැනීමකි. මන්ද, සිංහලයන්ට එවැනි කීර්තියක් සහිත දේශපාලකයකු ගැන බලා පොරොත්තුවක් තබා ගැනීමටවත් නො හැකි තරමට සිංහල සමාජය දූෂණයට ගොදුරු වී තිබෙන බැවිනි.


**3 Plots of Residential Property in Sri Lanka for sale, Sri Lanka .**

Owner migrated to Australia,
needs to sell following plots of land.
20 Perches with an old house at Sirigal Avenue , 300 meters to Kohuwala Junction. Price AUD 140 000/- (House not priced), negotiable

55 Perches In Kurunegala,
near Yanthampalawa junction on Puttalam road.
Price AUD 55000/- negotiable

40 Perches near Kurunegala on Puttalam Road , 6 Km from Kurunegala town, 1/2 Km from Pellandeniya junction.
Price AUD 25000/- negotiable

**Owner 's Tele No.: 0 451186850,**
**email: ekanayake100@hotmail.com**



**MONT ALBERT DENTISTS P/L**

For all Your Dental Requirements

We Provide

GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES

WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.

FOR APPOINTMENTS
9890 3609

DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS

DR. ENOKA JAYATILAKEBANDA (BDS)

MONT ALBERT DENTISTS

2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)

www.montalbertdentists.com.au